
# 24
# ඒකත්වයේ ජීවිත

ජොහාන් 17 : 20 23 ක්‍රියා 15 : 13 , එපීස 2 : 15 16 , 4 : 16
15 : 1 16 4 : 32 35, ගලාති 3 : 28




❖ <u>රට තුළ ඇති විවිධත්වය</u>

සියලු ජාතීන් ආගමිකයන් එක් වූ විට අපි ශ්‍රී ලාංකිකයෝ වෙමු. එකම රටක් තුළ නොයෙක් ජාතීන් හා විවිධ ආගම් වලින් පෝෂණය වූ අලංකාර හා වටිනා සංස්කෘතියකට හිමිකම් දක්වන්නෙමු. දේදුන්නේ වර්ණ සියල්ල ම එයට අලංකාර ගෙන දෙන්නා සේ ම අප රට තුළ ඇති විවිධත්වය නිසා අප රට අලංකාර වී ඇත.

එමෙන් ම අප ලෝකය ගැන සලකා බැලුවත් අසීමිත ව ජාතීන් ආගම් ලෙස ජනතාව රට රටවල විසුව ද එකම ලොවක් පෝෂණයට හා අලංකාරයට එම විවිධත්වය හේතු වී ඇත. දෙවියන් වහන්සේ එම විවිධත්වය මගින් ලොව අලංකාර කර ඇත.

❖ <u>සභාව බෙදී ඇති නිකාය සොයා බලන්න.</u>

වෙනත් නිකායවලට බෙදී සිටිය ද කිතුනුවන් සියල්ලෝ ම ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයෝ ය. අප රට තුළ පමණක් නොව මුළු මහත් ලෝකය පුරා සිටින කිතුනුවෝ ජේසුස් වහන්සේ තුළින් ඒකත්වයක් ලබති. ඒපීස 4 : 16 දැක්වෙන පරිදි " හිස වන උන්වහන්සේ කරණ කොටගෙන මුළු ශරීරය ......... ඒකාබද්ධ කරනු ලැබේ. " මෙලෙස ජගත් ලෝක කිතුනු සභාව ක්‍රිස්තුස් වහන්සේ මගින් ඒකත්වය කරා ගෙන එනු ලැබේ එය යථාර්ථය යි.



දේව වචන තුළින් ඒකත්වයේ වටිනාකම හුවා දක්වා ඇත. විවිධත්වයේ ඒකත්වය හා සමගාමිකයන් අතර ඒකත්වය යන අංශ දෙකම මෙයට ඇතුළත් වේ.( යහපත් එඬේරාණන් වන ජේසුස් වහන්සේ පවසන්නේ ජුදෙව්වන් සහ අන්‍ය ජාතීන් ද තම රැළට අයත් බව ය. ජොහාන් සුභ අස්න මෙය පැහැදිලි කර ඇත. " තවද මේ රැළට අයිති නොවූ බැටළුවෝ ද මට ඇත්තාහ ඔව්හු මගේ හඬට ඇහුම්කම් දෙති. මෙසේ එක රැළක් ද ඒක එඬේරෙක් ද වන්නා හ." ක්‍රිස්තුස් වහන්සේ වන එඬේරාණන් මඟින් කිතුනුවන් ඒකත්වයට ගෙන එන බව මෙයින් අනාවරණය කෙරේ.)

ජේසුස් වහන්සේගේ උත්තම පුජක යාච්ඤාව මේ ගැන සොයා බැලීමට ඉවහල් වේ. මොවුන් ගැන පමණක් නොව මොවුන්ගේ වචන කරණකොට ගෙන මා අදහා ගන්න අය ගැනත් කරමි..........." උන්වහන්සේගේ ගෝලයන් පමණක් නොව ඉන් පසුව එන සියලු අනුගාමිකයන් ද මෙයට ඇතුළත් වේ. ඒ සියල්ලන් ඒකත්වයට පැමිණෙන්නේ ජේසු සමිදාණන්ගේ ප්‍රේමයෙන් දිවි පිදීම හා උත්ථානය මඟින් ය.



තවත් විටක දී ජේසුස් වහන්සේ උන්වහන්සේ ව සමාන කර ඇත්තේ සැබෑ මිදි වැලකට ය. ජොහාන් 15 : 4 අනුව එතුමාණෝ පවසන්නේ අතු මිදිවැලට යාවී නැත්නම් ඵල දරන්නට නොහැකි වන්නා සේ ම ඔබ මා හා ඒකාබද්ධ නොවන්නේ නම් ඵල දැරිය නොහැකි ය කියා ය. නිසි ඵල දැරීමට ඒකත්වයෙන් වෙලී සිටීමටත් ක්‍රිස්තුස් වහන්සේ නැමැති මිදිවැලට කිතුනුවන් ඒකාබද්ධ වී සිටිය යුතු ය.

මුල් කිතුනු සභාව වන ජේසුස් වහන්සේගේ අනුගාමිකයන් උන්වහන්සේගේ උත්ථානයෙන් හා ස්වර්ගාරෝහණයෙන් පසු ක්‍රියා කළ ආකාරය පිරික්සා බලමු. මොවුන් සියල්ල පොදුවේ තබා ගනිමින් එකට බැඳී සිටි ආකාරය ක්‍රියා පොත අපට අනාවරණය කරයි. එකල සැදැහැවත් සමූහයා එක්සත් ව එක්සිත් ව සිටියහ. තමන් සතු දේ කිසිවක් තමන්ගේ ම යැ යි නොකීහ. සියල්ල පොදුවේ තබා ගත්හ. " (ක්‍රියා 4 : 32 ) මෙයින් පෙනී යන්නේ ජේසුස් වහන්සේගේ අපේක්ෂාව හා යැදුම අනුව මුල් කිතුනුවන් ඒකත්වයෙන් බැඳී සිටි බවයි.

කිතුනු සභාව ව්‍යාප්තවත් ම අන්‍ය ජාතිකයෝ (ග්‍රීක රෝම ) ද කිතුනු සභාවට ඇතුළත් වූහ. ඒ රෝම අධිරාජ්‍යයේ විවිධ පළාත්වල දහම් සේවයේ ප්‍රතිඵලයක් වශයෙනි. එහෙත් ජුදෙව්වන්ට මෙය යම් දුරට භේදයට හේතුවක් වූයේ තම ව්‍යවස්ථාව හා සිරිත් අනුව චර්මඡේදනය අනුගමනය නොකළ නිසා ය. එය ඒකත්වයට බාධාවක් බව පෙනී ගියෙන් ප්‍රථම මන්ත්‍රණ සභාව කැදවන ලදී. මෙය ජෙරුසලමේ පවත්වනු ලැබුවේ ය. එහිදී ඇති වූ වාදය සමථයකට පත් වූයේ පාවුල්තුමාගේ කථාවෙන් ය. දේව වරප්‍රසාදයෙන් ගැළවීම ලැබූ විජාතිකයන් වෙන් කළ හැකි ද යන්න මොහු සභාව ඉදිරියේ තැබූ ප්‍රශ්නය යි. ජුදෙව් කිතුනුවන් හා විජාතික කිතුනුවන් වශයෙන් බෙදීමට ඉඩ නොතබා මෙම මන්ත්‍රණ සභාවේ තීරණ මඟින් දෙපාර්ශවය ඒකත්වයට ගෙන ආ අන්දම අගය කළ යුතුය. සාකච්ඡා මඟින් ඒකත්වය ස්ථාපනය විය. සියලු ජාතීන් ජේසුස් වහන්සේ පිළිගැනීම මඟින් උන්වහන්සේ තුළින් ඒකත්වයට පිවිසෙයි.

ශුද්ධ ලියවිලිවල යැවුම් පත්‍ර මඟින් ද ඒකත්වයේ වටිනාකම ඔප් නැංවේ. එපීස වාසීනට ලියන ලද යැවුම් පත්‍රයේ 2 : 14 පවසා ඇත්තේ "ජුදෙව් හා විජාතීන් එක් කරමින් උන්වහන්සේ අප අතර සමඟිය ඇති කළ සේක. ඔවුන් අතර වෛරය ඇති කළ මැද බිත්තිය කඩා දැමූ සේක" කියා ය.

ඒකත්වය නිසා පණ ගැන්වෙන වැදගත් ආකල්ප සාරධර්ම කුමක් ද? ගලාති 3 : 21 29 කියවන්න එහි පවසා ඇත්තේ කුමක් ද? ඔබ සියල්ලෝ ජේසුස් වහන්සේ තුළ සිටින නිසා ජුදෙව් ග්‍රීක භේදයක්වත් දාස නිර්දාස භේදයක්වත් ස්ත්‍රී පුරුෂ භේදයක්වත් නැත. ජේසුස් අදහන සියල්ලන්ගේ විශේෂත්වය වන්නේ වෙනස්කම් පසෙක දමා ඒකත්වයේ සහෝදරත්වයෙන් බැඳී සිටීම යි. උන්වහන්සේ අදහන සකල ලෝක වර්ගය තුළ ම සමඟිය සහෝදරත්වය ගෙන දෙන්නේ එතුමාණෝ ය.

කොරින්ති වාසීනට ලියන ලද ලිපියේ පාවුල් තුමා දන්වා ඇත්තේ එකම ශරීරයේ අවයව සියල්ල ම විවිධ කාර්යභාරය ඉටු කරමින් එකම ශරීරයක් වන්නා සේ ම කිතුනු අප සියල්ලෝ විවිධ කාර්යයන් ඉටු කළ ද අයත් වනනේ ජේසුස් වහන්සේට බව ය. දේව රාජ්‍යයේ වර්ධනය නොයෙක් අයුරින් ක්‍රියා කරමින් එක්සත්කමින් ජීවත්වීමෙන් එහි වැදගත් කම ඉස්මතු කෙරේ. විවිධ කාර්යවල යෙදී සිටින විවිධ කුසලතා ඇති අය විය හැකිය. වෙනස් ජාතිකයන් විය හැකි ය. නොයෙක් තරා තිරම් දන්නන් විය හැකි ය. ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන් වන අප සැම දේව රාජ්‍යයේ හා ශු. සභාවේ පංගු කාරයන් ය.

බහුවිධ සමාජයක වෙසෙන කිතුනු අය ගැටුම් නිරාකරණය කරමින් වෙනස් කම් අවම කර ගනිමින් ඒකත්වය කරා පා තැබීමට ඇති අභියෝග පිළිගනිමු.

❖ <u>ඇගැයීම :-</u>

1. පාසලේ සිසුවෙක් / සිසුවියක් වශයෙන් ඔබගේ පාසල හා අවට පරිසරයේ විවිධ ආගමිකයන් හා ජාතින් සමඟ ඒකාත්වයෙන් සහයෝගයෙන් ජීවත් වීමට ගත හැකි පියවර කවරේ ද?

2. විවිධත්වය තුළ ඒකත්වය ගෙන ඒමට ක්‍රියා කරන දේශීය හා විදේශීය සංවිධාන හා ඔවුන්ගේ ක්‍රියා කලාප ගැන විමසා බලන්න.